www.agaram.lk

සියලුම හිමිකම් ඇවිරිණි/ முழுப் பதிப்புரிமையுடையது / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
வடமேல் மாகாணக் கல்வித் திணைக்களம்
Provincial Department of Education - NWP

9 ශ්‍රේණිය | පළමු වාර පරීක්ෂණය - 2019 | 11 S

බුද්ධ ධර්මය - I කොටස

නම .....

කාලය පැය දෙකයි

සැලකිය යුතුයි. :
- පළමු කොටසේ ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.
- දෙවන කොටසේ පළමු ප්‍රශ්නය ඇතුළු ව ප්‍රශ්න 05 කට පමණක් පිළිතුරු සපයන්න.

- අංක 01 සිට 05 දක්වා ප්‍රශ්න වලට නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

(01) බුදුරජාණන් වහන්සේ වැඩ සිටියදී පැවිදි ව රහත් වූ අන්තිම රහත් ශ්‍රාවකයා වූයේ,
1. ආනන්ද හිමිය. 2. සුභද්‍ර හිමිය. 3. අස්සජි හිමිය. 4. චුන්ද හිමිය.

(02) බුදුරජාණන් වහන්සේ සුනීත, සෝපාක යන අයට පිහිට වූ ආකාරයෙන් ප්‍රකට වන්නේ උන්වහන්සේ තුළ පැවති,
1. නම්‍යශීලීත්වයයි. 2. ඍජු බවයි. 3. අකම්පිත බවයි. 4. කාරුණික බවයි.

(03) ආගන්තුක සංග්‍රහයක් වුවද පිළිගැන්වීමට සුදුසු වන නිසා සංඝ රත්නය,
1. උජුපටිපන්න නම් වේ. 2. පාහුනෙය්‍ය නම් වේ.
3. සාමීචිපටිපන්න නම් වේ. 4. දක්ඛිණෙය්‍ය නම් වේ.

(04) සිරිපා සලකුණ පිහිටුවා බුදුරජාණන් වහන්සේ දිවා කාලයෙහි විවේක සුවයෙන් ගත කළ ස්ථානය,
1. මුතියංගණය ය. 2. නාගදීපය ය. 3. දිවාගුහාව ය. 4. කැළණිය ය.

(05) භාවනාව ප්‍රගුණ කිරීමේ දී ගැහැණු දරුවන් වාඩි විය යුතු ක්‍රමය කුමක්ද?
1. පහසුවෙන් 2. බද්ධ පර්යංකය 3. අර්ධ පර්යංකය 4. සීරුවෙන්

- අංක 6 - 10 දක්වා ප්‍රශ්න වලට නිවැරදි පිළිතුර පහත වරහන් තුළින් තෝරා හිස්තැන් පුරවන්න.

(06) කාන්තාවන්ට පැවිද්ද ලබා දීමේ දී බුදුරජාණන් වහන්සේ ..... පිළිගැනීමෙන් පැවිදි උපසම්පදාව ලැබෙන බව ප්‍රකාශ කළහ.

(07) ධම්ම පදය ..... නිකායට අයත් ග්‍රන්ථයකි.

(08) දුක සැප දෙකෙහි දී මැදිහත් සිතුවිලි පවත්වා ගෙන යාම ..... නම් වේ.

(09) බුදුරජාණන් වහන්සේ සතරමහාපදේස දේශනා කළේ ..... නගරයේදී ය.

(10) ශරීරයට අධික සැප සම්පත් ලබා දීම ..... නම් වේ.

(බුද්දක / අෂ්ට ගරු ධර්ම / භෝග / උපේක්ඛා / කාමසුඛල්ලිකානු යෝගය)

- ප්‍රශ්න අංක 11 සිට 15 දක්වා දී ඇති ප්‍රකාශය හරිනම් (✓) ලකුණ ද, වැරදි නම් (X) ලකුණ ද වරහන තුළ යොදන්න.

(11) ත්‍රිවිධ රත්නයෙහි තුන්වැනි රත්නය වන්නේ මහා සංඝ රත්නයයි. ( )

(12) සංවර ඇඳුමෙන් සැරසීම වන්දනා ගමනක දී අනුගමනය කළ යුතු සිරිතකි. ( )

(13) හද්දකච්චායනා තෙරණිය වසර 120 ක් අවසානයේ පිරිනිවන් පෑවාය. ( )

(14) ලෝවැඩ සඟරාව වීදාගම මා හිමියන්ගේ රචනයකි. ( )

(15) බුදු දහමේ දෙමාපියන් උපමා කරන්නේ දෙවියන්ටය. ( )

agaram.lk

Agaram.LK - Keep your dreams alive!

www.agaram.lk

• **ප්‍රශ්න අංක 16 - 20 දක්වා (A) තීරුවට ගැළපෙන පිළිතුරු (B) තීරුවෙන් තෝරා පිළිතුරට අදාල අංකය වරහනෙහි යොදන්න.**

(A) තීරුව		(B) තීරුව
(16) මිහින්තලය සේල චෛත්‍යය	( )	(i) යශෝදරා දේවිය
(17) අටමස්ථානයට අයත්ය.	( )	(ii) සිව් බඹ විහරණ
(18) චන්දකින්නර ජාතකය	( )	(iii) ඡන්න හිමි
(19) චතු අප්පමඤ්ඤා	( )	(iv) ජේතවනය
(20) බ්‍රහ්ම දණ්ඩය	( )	(v) බුදුරදුන්ගේ ඌර්ණ රෝම ධාතුව

(ලකුණු 02x20 = 40යි)

II කොටස

• **පළමු වන ප්‍රශ්නය ඇතුළු ව ප්‍රශ්න 05 කට පිළිතුරු සපයන්න.**

(01) කෙටි පිළිතුරු සපයන්න.

i. අෂ්ට ලෝක ධර්මයට අයත් කරුණු අතරින් 2 ක් නම් කරන්න.
ii. දෙමාපිය අවසරයකින් තොරව දරුවන් පැවිදි නොකරන්නැයි බුදුරජාණන් වහන්සේගෙන් ඉල්ලීමක් කළේ කවුද ?
iii. සාමීචි කර්ම 2ක් ලියන්න.
iv. සොළොස්මස්ථාන අතර රත්නපුර දිස්ත්‍රික්කයට අයත් සිද්ධස්ථාන 02 ක් නම් කරන්න.
v. ප්‍රජාපතී දේවියගේ දරුවන් දෙදෙනා කවුරුන් ද ?
vi. බිම්බිසාර රජතුමා කරවූ ආරාමය කුමක් ද ?
vii. බුදුරජාණන් වහන්සේ ලංකාවට වැඩම කළ ස්ථාන 2ක් ලියන්න.?
viii. සම ආනිසංස සහිත දාන දෙක නම් කරන්න.
ix. ස්ථූප තනා පිදිය යුත්තෝ 4 දෙනෙකි. ඉන් දෙදෙනෙක් නම් කරන්න.
x. බුදුරජාණන් වහන්සේ පහල වූ සමයේ භාරතීය සමාජයේ තිබූ චතුර් වර්ණ අතරින් දෙකක් ලියන්න.

(ලකුණු 2x10 = 20 යි)

(02) i. බුදු සසුනේ පැවිදි වූ කාන්තාවන් දෙදෙනෙක් නම් කරන්න. (ලකුණු 02 යි)
ii. "කැලේ තියෙන කොයි දේවත් රස වේවා" කවිය සම්පූර්ණ කරන්න. (ලකුණු 03 යි)
iii. මහා ප්‍රජාපති ගෝතමියගේ චරිතයෙන් ගත හැකි ආදර්ශ පැහැදිලි කරන්න. (ලකුණු 05 යි)

(03) i. අත්හළ යුතු අන්ත දෙක නම් කරන්න. (ලකුණු 02 යි)
ii. සඟ ගුණ තුනක් ලියන්න. (ලකුණු 03 යි)
iii. සඟ ගුණ ඇසුරින් ඔබේ දිවියට ගත හැකි ආදර්ශ 5 ක් ලියන්න. (ලකුණු 05 යි)

(04) i. "අත්තනාව කතං පාපං" ගාථාව සම්පූර්ණ කරන්න. (ලකුණු 02 යි)
ii. එහි සිංහල තේරුම ලියන්න. (ලකුණු 03 යි)
iii. ධම්ම පදයෙන් ලබා දෙන ආදර්ශ මොනවාදැයි පැහැදිලි කරන්න. (ලකුණු 05 යි)

(05) i. සිව් බඹ විහරණ නම් කරන්න. (ලකුණු 02 යි)
ii. එයින් එකක් කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 03 යි)
iii. සිව් බඹවිහරණ ප්‍රගුණ කිරීමෙන් ලැබෙන ප්‍රයෝජන පැහැදිලි කරන්න. (ලකුණු 05 යි)

(06) i. බෞද්ධයන් යෙදෙන වන්දනා ගමන් 2 ක් නම් කරන්න. (ලකුණු 02 යි)
ii. ශ්‍රී පාද වන්දනාවේ දී භාවිත කරන විශේෂ වචන 3 ක් ලියන්න. (ලකුණු 03 යි)
iii. අර්ථාන්විත වන්දනය තුළින් පුද්ගල සංවර්ධනය සිදුවන ආකාරය පැහැදිලි කරන්න. (ලකුණු 05 යි)

(07) පහත දී ඇති මාතෘකා දෙකක් තෝරාගෙන කෙටි සටහන් ලියන්න.
i. භද්දකච්චායනා තෙරණිය
ii. ආනාපානාසති භාවනාව
iii. කතරගම කිරි වෙහෙර
iv. ධම්ම පදය

(ලකුණු 05x2 = 10 යි)

agaram.lk
Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!